මගේ අංක: ඩී16/ස්ථානමාරු /2017
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.
2018.02.19

සියලුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

**<u>වර්ෂ අවසාන ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ - 2017</u>**

මගේ අංක: ඩී16/ස්ථාන මාරු/2017 හා 2017.11.22 දිනැති ස්ථානමාරු මණ්ඩල තීරණ වලට අනුව ඉදිරිපත් කර ඇති සමාලෝචන ඉල්ලීම් සලකා බලන ලද අතර, එම ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ මේ සමග අමුණා ඇත.

02. සමාලෝචන කමිටු තීරණ 2018.03.05 දින සිට ක්‍රියාත්මක විය යුතු අතර, ස්ථානමාරු ලැබී ඇති සියළුම නිලධාරීන්ට ඒ බව දැනුම් දීමට කටයුතු කරන්න.

03. අභියාචනා ඉල්ලීම් ඉදිරිපත් කළ ද ,මෙම ලේඛනයේ නම් සඳහන් කර නොමැති නිලධාරීන්ගේ ස්ථානමාරු සමාලෝචන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වී ඇති අතර, ඔවුන් හට ස්ථානමාරු මණ්ඩලය විසින් ස්ථාන මාරු ලබා දී ඇති නම්, එම ස්ථාන මාරු 2018.03.05 දින සිට ක්‍රියාත්මක කළ යුතුය.

04. සමාලෝචන කමිටු තීරණ අනුව ප්‍රමාද කර ඇති ස්ථාන මාරුවීම්, දක්වා ඇති කාල සීමාවන් පසු අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතු බව දන්වමි.

05. මීට පෙර වසර වල ප්‍රමාද කර ඇති ස්ථානමාරු 2018.03.05 දින සිට අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතු බව දන්වමි.

06. විශ්‍රාම යාමට යටත්ව ස්ථාන මාරු අවලංගු කරන ලද හෝ ප්‍රමාද කරන ලද නිලධාරීන්ගේ ස්ථානමාරු, ඔවුන් විශ්‍රාම නොයන්නේ නම් අනිවාර්යෙන්ම ක්‍රියාත්මක කළයුතු බව දන්වමි. එම නිලධාරීන් මෙතෙක් විශ්‍රාම අයදුම්පත් ඉදිරිපත් කර නොමැති නම්, කඩිනමින් එම විශ්‍රාම අයදුම්පත් මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

**සමාලෝචන කමිටුව: -**

01. එච්.එම්.එන්.සී. ධනසිංහ (සභාපති) - බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
02. ජේ.ඒ.ටී. ජයසිංහ (සාමාජික) - බන්ධනාගාර කොමසාරිස් (මෙහෙයුම්)
03. සී.එස්. අමරවික්‍රම (සාමාජික) - පරිපාලන නිලධාරි I

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය,**
**කොළඹ 09.**